# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2484/02 - 2026 අප්‍රේල් මස 15 වැනි බදාදා - 2026.04.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දැක්වෙන විරෝධතාවයන් 2026 අප්‍රේල් මස 30 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
සභාපති,
පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2026 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ 05,
"මෙහෙවර පියෙස",
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A - G 46604 — 08 (2026/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1949 අප්‍රේල් මස 30 අංක 99/71 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2018.09.25 වන දින අංක 2090/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ වූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

එම උපලේඛනයේ II වැනි කොටසේ කෑලි මිම්මේ සේවකයන්ට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් මෙසේය.

| කාර්යය | | පඩි ප්‍රමාණය<br>රු. ශත |
|---|---|---|
| 1) | වැවිල්ල දැමීම හා නඩත්තු කිරීම, පොල් කැඩීම ගස් 1000 ක | 5400.00 |
| 2) | කොප්පරා තැනීම, පොල් ලෙලි ගැසීම, පොල් බිඳීම, කොප්පරා වේලීම හා තේරීම ගෙඩි 1000 ක | 1450.00 |

**(2) කාර්යයන්**

(අ) පොල් වැවිල්ලක් වගා කිරීම සහ පවත්වාගෙන යාම

(ආ) කොප්පරා සෑදීම

ඉහත කාර්යයන් සම්බන්ධයෙන් කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ:

| | |
|---|---|
| සියලු කම්කරුවන් සඳහා දිනකට | රු. 1350.00 |

ගව පාලනයේ නියුතු යම් සේවකයෙකුට වැඩ වේලා සඳහා ඉරිදාට ගෙවිය යුතු පඩි ප්‍රමාණය විය යුත්තේ මෙම කොටසේ කලින් දී ඇති විධිවිධානවලට ඇතුළත් කිසියම් ප්‍රතිවිරෝධී කරුණකින් ප්‍රතිශෝධනය නොවූ වැඩ කරන සාමාන්‍ය දවසකට ඒබඳු සේවකයෙකුට ගෙවිය යුතු පඩි ප්‍රමාණය මෙන් එකහමාර ගුණයකි.

**III "ඒ" වන කොටස**

(අ) කොන්දොස්තර කෙනෙකුගේ වැඩවලට

(ආ) මුරකරුවෙකුගේ වැඩවලට අදාළ කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය

අදාළ කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ

| අක්කර ප්‍රමාණය | | මුරකරු<br>රු. | කොන්දොස්තර<br>රු. |
|---|---|---|---|
| 1) | අක්කර 10 ට නොඅඩු එහෙත් අක්කර 25 ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | 33750.00 | අදාළ නැත |
| 2) | අක්කර 25 ට නොඅඩු එහෙත් අක්කර 50 ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | 34750.00 | 35250.00 |
| 3) | අක්කර 50 ට වැඩි පොල් වැවිල්ලක් හෝ කොටසක් නම් | 35750.00 | 36250.00 |

EOG 04 - 0063

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.